# පියදාස සිරිසේනයන්ගේ නව කතා රචනාවන්ට සිංහල ජාතික ව්‍යාපරයෙන් වූ බලපෑම

යුද්ධයක් පවතින රටක් තුළ නිරන්තරයෙන් රැව් පිළි රැව් දෙන වදන වන්නේ "සාමය" යි. එමෙන්ම, ජාතිය වෙත යම් විජාතීය බලපෑමක් එල්ල වන අවස්ථාවකදී නිරන්තරයෙන්ම සවන් වැකෙන්නේ "ජාතික අධිනභාවය", "ජාතික නිදහස", "ජාතික අභිමානය" ආදී වාක්‍යාංශයි. ජාතික සහ එහි සංස්කෘතික පරිහාණිය වැළැක්වීමත්, ජාතියේ අභිවෘද්ධියත් යන අවැසිතා ද්වය තීව්‍ර ලෙස ජනිත වන්නේ යම් කලෙකද, ඒ සඳහා ජාති හිතෛෂීන් විසින් ජාතික උන්නතිය උදෙසා ගනු ලබන සකල විධ ක්‍රියා දාමයන්ගේ ඒකරාශී බව "ජාතික ව්‍යාපාරය" ලෙස හැඳින්විය හැක.

යම් දේශයක් තුළ ජාතික ව්‍යාපාරයක් දියත් වන කාල පරිච්ඡේදයකදී එම රටෙහි දේශපාලනික, ආගමික, සංස්කෘතික, ජන මාධ්‍යයික ආදී වූ ජන සමාජයට බලපෑම් එල්ල කිරීමෙහි බලයෙන් යුතු විවිධ අංශයෙන් තුළ ස්වජාතිකත්වයෙහි අග්‍රගණ්‍ය බව පිළිඹිබු කරන මතවාද නිරන්තරයෙන් ඉස්මතු වන අයුරු අපට දෘශ්‍යමාන වේ.

ජාතික ව්‍යාපාරයක් තුළ කැපී පෙනෙන ලක්‍ෂණ මෙසේ හුවා දැක්විය හැක.

- සතතින්ම ස්වජාතිකත්වය මහානර්ඝ කොට හැඟෙන ලෙස අදහස් හුවා දැක්වීම
- විජාතික ආකල්ප, සංස්කෘතිය, ආචාර ධර්ම, සිරිත් - විරිත් ආදිය හෙළා දැකීම
- ස්වජාතිකත්වය විජාතිකත්වයට වඩා උතුම් බව නිරන්තරයෙන්ම තරක දක්වමින් සාධනය කිරීමට වෙහෙසීම
- ජනයා තුළ ජාති හිතෛෂී බව තීව්‍ර කිරීම උදෙසා විවිධ ක්‍රියා මාර්ග දියත් කිරීම

හෙළ දිවයිනට ජාතික ව්‍යාපාරයක් අවැසි බව හැඟෙන්නට වූයේ යුරෝපීයයන් මෙරටට පැමිණ අපගේ සංස්කෘතියට හා පොදු ජන සමාජයට බලපෑම් එල්ල කරන්නට වූ තැන් පටන්ය. මුළු දිවයිනම සියතට ගත් ඉංග්‍රීසි පාලන යුගයේදී සිංහලයන් තුළින්ම පැණ නැගුණු ජාතික ව්‍යාපාරය ඉතා ශක්තිමත් හා බලවත් වූවකි. මෙම ව්‍යාපාරය උදෙසා සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් භේදයකින් තොරව "සිංහල ජාතිය" ලෙස සියල්ලන් එක්සත්ව ක්‍රියා කළ අතර වදනින් ප්‍රහාර එල්ල කරන චතුර කථිකයෝද, පන්හිඳෙන් ප්‍රහාර එල්ල කරන විදග්ධ ලේඛකයෝද ලක් ජාතිය වෙනුවෙන් තම ශක්තිය හැකි පමණින් ගොනු කරන්නට වූහ. ලංකාව තුළ ජාතික ව්‍යාපාර ක්‍රියාත්මක වූයේ 1948ට දශක කිහිපයතටම පෙර සිටය. හෙළ සාහිත්‍යය ක්ෂේත්‍රයට එවකටත් අපූර්ව අත්දැකීමක් වූ නවකතා සාහිත්‍යද ජාතික ව්‍යාපාරයෙන් ආභාසය ලැබුවේ එකල ලක්දිව පුරා පැවති මෙම දේශපාලනික හා සමාජයීය පසුබිම හේතුවෙනැයි සිතීම උගහට නොවේ.

සිංහල ජාතික ව්‍යාපාරය සමග සිංහල නවකතාකරණය අනුයාත වීම පිළිබඳව විමසන විට, *පියදාස සිරිසේන* නාමයට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. ජාතික ව්‍යාපාරයේ කැපී පෙනෙන වීරෝදාර චරිතයක් වු අනගාරික ධර්මපාලතුමාගේ අදහස් පියදාස සිරිසේනගෙ බොහෝ නවකතාවලට පිටුබල වූ අතර, ඇතැම් තැනකදී හෙතෙම ධර්මපාලතුමාටත් වඩා ආවේග ශීලී ලෙස අදහස් පළ කිරීමට පෙළඹී ඇති බැව්ද අපට විශද වේ.

පියදාස සිරිසේන විසින් විරචනා කරනු ලැබූ "යන්තම් ගැලවුනා", "මහා වියවුල", "තරුණියකගේ ප්‍රේමය", "සුචරිතාදර්ශය", "ඩෙබර කෙල්ල", "විමලතිස්ස හාමුදුරුවන්ගේ මුදල් පෙට්ටිය හෙවත් වික්‍රමපාලගේ දෙවන වික්‍රමය", "වාසනාවන්ත විවාහය හෙවත් ජයතිස්ස හා රොසලින්", "පසන් නිවස" යනාදී කෘති සියල්ලම පාහේ මෙවන් වූ දේශ හිතෛශී ආකල්පවලින් හෙබි ඒවා විය.

එක් එක් කෘතියේදී ඒ පිළිබඳව කර්තෘගේ අදහස් සමුච්ඡගත වන සංඥාපනයේදී පියදාස සිරිසේන දක්වා ඇති අදහස් තුළින්ද ඔහු වෙත පැවති ජාතික ව්‍යාපාරය හා බද්ධ වූ ආකල්පයන් මැනවින් දෘශ්‍යමාන වේ. එම කෘතිවල අන්තර්ගත වෙතින්ද වැඩි දුර කරුණු සාධනය පිනිස පිටුබල සැපයේ.

"විමලතිස්ස හාමුදුරුවන්ගේ මුදල් පෙට්ටිය හෙවත් වික්‍රමපාලගේ දෙවන වික්‍රමය" කෘති සංඥාපනයේදී රචකයා මෙසේ සඳහන් කරයි.

*"දේශපාලන, අර්ථ සංවර්ධන, සදාචාරය, ජාති මමත්වය ආදිය සමාන්‍ය ජනයාට ඉගැන්වීමට තිබෙන උපාය මේ ප්‍රබන්ධ කථා බව අපට අවබෝධ වූයේ පාඨශාලාවට යන කාලයේදීමයි."*

සදාචාරය හා ලාංකික සමාජ සභ්‍යත්වය පිළිබඳව තම නිරන්තර අවධානය යොමු කරන මේ රචකයා විවාහයකදී සිංහලයන් දැක් වූ අන්‍යොන්‍ය ගෞරවාදරය, භක්තිය ආදිය බටහිරකරණය වූවන් විසින් නොසලකා හැර ඇති ආකාරය පාඨකයා තුළ නොපහන් බවක් ජනිත වන ආකාරයට මෙසේ ඉදිරිපත් කරයි.

*"මිස්ට පෙරේරා -*

*මගේ විවාහ යෝජනාව සම්භන්ධව තමුසේ ඇසුවොත් පුදුම නොවී නොසිටින්නෙහිය. මම ඉස්කෝලේ යන කාලෙම අපේ මාමා කෙනෙකුගේ දුවක් කසාද බඳින්ට සිතාගෙන අවුරුදු පහක් පමණ නොයෙක් මිත්‍රකම් පවත්වමින් සිටියෙමි. ඒ මගේ නෑනා වන "ගර්ලි" පුදුම "ජොලි ගර්ල්" කෙනෙකි. මා සමඟ පමණක් නොව ඈ තවත් දෙන්නෙකු සමඟ "ලව් මේකිං" කරමින් උන්නා... නමුත් අපේ මාමාට වැඩි දේපලක් නැත. ඒ නිසා "පප්පා" ඒ කසාදයට සතුටු නැතුව ඒක අත් ඇර දමන්නට කීයේය. ඉන්පසු කළුතර පෙරකදෝරු මහතෙකුගේ දුවක් ජෝඩු වී අවුරුදු දෙකක් පමණ අපි "ලව් මේකිං" කරමින් ලබන මාසේදී බඳින්නට තීන්දු කරගෙන සිටියෙමු. ඒ අතර අපේ ගමට එහා ගමේ අන්තෝනි සිල්වා උන්නැහේ රුපියල් තිස්පන්දාහක් දෙනවැයි කියා දුව ජෝඩු කරන ලදී. ඉතින් එකපාරටම අර පෙරකදෝරු තැනගේ දුවත් අත් හැර ඒකට සතුටු වීමි."*

විවාහ පොරොන්දු ආදිය හිටි හැටියේම මුදල් නිසා කඩා දමන පෙරේරාගේ චරිතය වනාහි බටහිර සිරිතට ගැති චරිතයක් ලෙස රචකයා හුවා දක්වයි. "ජොලි ගර්ල්", "ලව් මේකිං" ආදී ඉංග්‍රීසි වදන් සිංහලය මැදට යොදමින් කථා කරන ලක්‍ෂණය යථෝක්ථ කරුණ මැනවින් සාධනය කරයි. ඔහු වසර පහකුත්, වසර දෙකකුත් බැගින් ගැහැණු ළමයින් ආශ්‍රය කර ඔවුන්ව අත් හැර දමා ඇත්තේ දෑවැද්ද යන නිර්ණායකයම පමණක් පදනම් කරගනිමින්ය. ආදරය හෝ අන්‍යෝන්‍ය ගෞරවය ආදිය මුදල හමුවේ යටයවන අතරම විවාහයේදී ඔවුන් වැදගත් කොට සලකන නිර්ණායකයන් කවරේදැයි පහත ප්‍රකාශයෙන් දෘශ්‍යමාන වේ.

*"මිස්ටර් පෙරේරා -*

*මේරි ද සිල්වා නැමැති ඒ තරුණිය සිංහල භාෂාව හොඳට දන්නවා. බුද්ධාගමත් හොඳට දන්නවා. බුද්ද්ධාගමත් හොඳට දන්නවා. නමුත් එයින් අපිට වැඩි පලක් නැත. අපි නම් නමින් බුද්ධාගම්කාරයෝ තමා. නමුත් අපිට ඔය ආගම ඇදහීමට බැරිය. දැන් අපි පළමුවෙනි පංක්තියේය. පළමුවෙනි පංක්තියේ මිනිස්සුන්ට මොන ආගම්ද? හොඳට කා බී සෙල්ලම් කරන්ට තිබෙන කාටවත් ආගමකින් වැඩි පලක් නැත. මෙ නිසා මේරි ද සිල්වාගේ ආගම, ශාස්ත්‍ර දැනීම, අපට වැඩි අගයක් නැති නමුත් රූප ලක්‍ෂණයෙනුත් වැඩි වරදක් නැති කදිම ගෑනියෙකි. රූප ලක්‍ෂණ නරක් වුවත් රුපියල් තිස්පන්දාහක් මුදලින්ම දෑවැද්ද ලැබෙන කොට මක් කරන්ට බැරිය. ඈ කසාද බැඳලා වෙන මට උවමන් හැටියකට "ඇන්ජෝයි" කරන්ට බැරිද ?"*

පරගැති සමාජ පන්තිය සංකේතවත් කරන පෙරේරාගේ චරිතය මෙසේ දිගින් දිගයටම දොඩමළු කරවීමෙන් රචකයා උත්සහ දරන්නේ ජාතික හැඟීමෙන් හෝ මනුෂ්‍ය හැඟීමෙන් හෝ තොරව හුදු මුදල හා දෑවැද්ද ආදී වූ තණ්හාධික දෑ පසුපස හඹා යන චරිත, බටහිර ආකල්ප අනුගමනය කිරීම තුළින් බිහිවන බවය.

ලංකා සමාජය තුළ විවාහයක් අසාර්ථක වීම කෙරෙහි බලපාන්නා වූ ප්‍රධානතම හේතුව වන්නේ සිංහල සංස්කෘතියෙන් වියුක්ත බටහිර මතවාද දැරීම යැයි "සුචරිතාදර්ශය" නැමැති කෘතියේදී පියදාස සිරිසේනයෝ මෙසේ දක්වති. විවාහ වීමේදී බටහිර මිනුම් දඬු භාවිතය නිසා රුද්‍රිගුට සිදු වූ විපත, ඔහු හා විජේරත්න අතර ඇතිවන දෙබසින් හෙළිවේ.

*" රුද්‍රිගු - ඈ ගෙදර දොරේ වැඩ මොකවත් නොදනිතත් සීනියර් ලෝකල් පාස් කළ කෙනෙකි. ලොකුම ලොකු ඉංග්‍රීසි ගැහැණු කොලීජියක අවුරුදු හතක් බෝඩිං වෙලා සිටි කෙනෙකි. නමුත් දැන් ඈ මට අබමල් රේණුවක් තරම්වත් ආදරේ නැත."*

මෙවිට දේශියත්වය අගයන හෙළ බොදු සාරධර්ම අදහන විජේරත්න මහතා පංචශීලයෙහි වටිනාකම සහ අන්‍යෝන්‍ය විශ්වාසය රැකීම පිළිබඳව කරුණු දක්වමින් විවාහයේ අත්‍යවශ්‍ය සාධක ඒවා බව පවසයි. එවිට,

*"රුද්‍රගු - අනේ මහත්මයා ඕවා අපි කවදාවත් ඇහුවෙත් නැත. අප නම් ආදරේ සලකා ඉංග්‍රීසි උගත්කමත් සලකා කසාද බැන්දා."*

*විජේරත්න - ඉතිං මහත්මයාට උනු ඇබැද්දිය ගැන පුදුමද ?"*

යැයි කරන ප්‍රකාශයන්ගෙන්ද තහවුරු වන්නේ, එම බටහිර මිනුම් දඬුවල ඇති අනෞචිත්‍ය බවයි.

පියදාස සිරිසේනයන්ගේ "යන්තම් ගැලවුණා" නම් කෘති සංඥාපනයේදී මෙසේ පැවසෙයි.

*"අපේ සිංහල ජනයා යථා මාර්ගයෙහි යොදවනු සඳහා අප විසින් ලියන ලද පොත් බොහෝ වෙති. "නව ප්‍රබන්ධ" යන නම මේ කාලයේ ව්‍යවාහාර කරතත්, අපේ පොත්වල ධර්ම ශාස්ත්‍රීය කරුණුවලින් පිටස්තර කිසිවක් නැත."*

එමෙන්ම "මහා වියවුල" හි සංඥාපනයේදී රචකයා ජාතික ව්‍යාපාරයෙන් උකහා ගත් ආකල්ප වඩ වඩාත් තීව්‍ර කර දක්වයි.

*"බොහෝ දෙනා විසින් ලියනු ලබන ප්‍රබන්ධ කථා කාලය ගත කිරීමට හේතුවන නමුත් මේ කථ ාවෙන් හා මගේ අනික් පොත්වලින්ද ජාති ධර්ම ශාස්ත්‍රයත් දේශපාලන ක්‍රමයන් ඉගැන්වීම සිද්ධ වේ. ජාති මමත්වය හා වාත්සල්‍ය ඇති වීමටත් මෙකල සිංහලයන් අතර ප්‍රකට පොත් ඉතා විරල හෙයින් මේ පොත් පඬිතය පිළියෙල කළෙමි."*

කතුවර අභිප්‍රාය වන්නේ, දේශජ සංස්කෘතියෙහි අග්‍රහණ්‍ය භාවය තීව්‍රකර දැක්වීමම බව අපට දෘශ්‍යමාන වේ. "තරුණියකගේ ප්‍රේමය" නම් ග්‍රන්ථයෙහි රචනය කිරීමේ අරමුණ වශයෙන් සංඥාපනයේ සඳහන් වන්නේ,

*"තරුණියකෙගේ ප්‍රේමයේ.... වනාහි ස්ත්‍රීන්ගේ ගුණ ධර්මාදියම විශේෂ වශයෙනුත් ජාත්‍යාලයාදී අන්‍ය ගුණ ධර්ම සාමන්‍ය වශයෙනුත් වර්ධනය කරුණු සඳහා ලියන ලද්දකි."*

යනුවෙනි. පියදාස සිරිසේන විදේශිකයන් අනුග මනය කළා වූ කූට ක්‍රියා පිළිවෙත්වලට තදින්ම විරුද්ධත්වය ප්‍රකාශ කර සිටියේය. විජාතික අධ්‍යාපන ක්‍රමයට විරුද්ධත්ව කථා කළ ඔහු,

*"දැන් අප රටේ පවත්නා ඉගැන්වීම් ක්‍රමයේ වරදිනුත් අනාර්ය පහත් ජාතීන් සමඟ සංකීරණ වීමෙනුත් සිංහල ජාතිය විනාශ වේගෙන යන බැව් දුටු අප විසින්ම මේ පොත ලියන ලද්දේ අවංක වූ ජාති ආලයෙන්මය..."*

යනුවෙන් "ඩෙබර කෙල්ල" නම් කෘති සංඥාපනයේදී පවසා සිටීයි. මේ අදහස සපථ කරන අවස්ථා සිරිසේනයන්ගේම "පසන් නිවස" ධර්ම ශාස්ත්‍රීය ප්‍රකරණය" කෘතියෙන් උපුටා දැක්විය හැක.

*"මහලු නෝනා - .... මා විවාහ වුනාට පසු මගේ ස්වාමි පුරුෂයාගේ පාද පරිචාරිකාවක්, මිතුරියක් හා භාර්යාව යන යුතුකම් හැමදාම ආරක්‍ෂා කර ගත්තෙමි. අප නිසා අටගත් දියණිය හා පූත්‍රයාද අපේ ගතිගුණවලට වඩා කොහෙත්ම අඩුවුණේ නැත. නමුත් මගේ පුත්‍රයා මිෂනරි ස්කෝලයකට යවා ඉංග්‍රීසි උගැන්වූ බැවින් ඔහු තරුණයා වූ පසු මත්පැන් ආදිය බොන පාප මිත්‍රයන් ආශ්‍රය කිරීම නිසා අපේ මුල් තත්ත්වය හුගක්ම වෙනස් විය. ධනය මදිකම ඔහුට මහත් කරදරයක් වූ බැවින් ස්ත්‍රීයකගේ දායාදය ලොකුවට සැලකූ ඔහු දැන් කසාද බැඳගෙන ඉන්නා ලෝටස් නැමැති උරචක්‍රමාලය කාර්ලා ගත්තේය."*

මීට අමතරව ඔහු ස්වභාෂා අධ්‍යාපනයේ වැදගත්කම, දේශීය වෙදකමේ උසස් බව, දුෂ්චරිතයන්ගේ ආදීනව, හෙළ ඇඳුම්වල අගය මෙන්ම කුළ භේදය හා වර්ණ භේදයේ නිශ්ප්‍රයෝජනභාවයේ ආදී තේමා රැසක් තම කෘතිවලදී ස්පර්ෂ කළේය. ඉහත දී පුතුට මිෂනරි අධ්‍යාපන ලබා දීම පිළිබඳ පසුතැවෙන මවකගේ හඬ අවධි කළාක් මෙන් කුල භේදය පිළිබඳව "විමලතිස්ස හාමුදුරුවන්ගේ මුදල් පෙට්ටිය" කෘතියේදී කථකයා හා සුමනතිස්ස ස්වාමීන් වහන්සේ මෙසේ කථිකා කරති.

"සුමනතිස්ස ස්වාමීන් :- *මහත්මයා දැන් ලක්දිව පවත්නා කුල භේදය වැරදිය; හය සිංහල ජාතියේ දියුණුවට මහත් භාධාවක්ය; ඇත්ත වශයෙන් අමිශ්‍ර වූ එකම කුලයක්වත් නැත යනාදිය කියන බැව් සැබෑද ?*

මම :- *ඔව් ස්වාමීන් වහන්ස, මම නිතරම එසේ කියමි.*

*සුමනතිස්ස ස්වාමීන් :- මහත්මයා එසේ කියන්නේ කවර බලයක් පිටද ? ....*

*මම :-... දැන් කරාව ගෝත්‍රයේ සිංහල මිනිස්සු ටික දෙනා "ක්ෂත්‍රීය යි කියමින් අනිත් සිංහල මිනිස්සුන්ට වඩා ඉහළ යන්ට උත්සහ කිරිමෙන් ප්‍රයෝජනයක් තිබේය කියා තමුන්නාන්සේ සිතන්නෙහිද ?*

*සුමනතිස්ස ස්වාමීන් :- ඇයි ? බලන්න අපට තවමත් ගොයිගම ආදී "ජාතිවල" මිනිස්සු කරන නිගරුව ? ඒ නිසා අපේ උසස්කම නොකිවුවෙත් අපට වෙන්නේ මහා වැරැද්දක් නොවැ.*

*මම :- ස්වාමීනී, තරහ වෙන්ට එපා. ඔබ වහන්සේගේ ලුහුඬු කල්පනාව නිසා අපේ ජාතිය, සිංහල ජාතිය විනාශ වුණා. ගොයිගම කුලයේ හෝ වෙන කුලවල මිනිස්සු අපේ කුලයට හෙලා දක්වා අසමගි වූවාහු නම් එයින් ලැබුනු ප්‍රයෝජනය ඒ ගොයිගම මිනිස්සු හෝ අන්‍යයෝ ඉහළ ගියාහු නොව සිංහල ජාතිය දුර්වල වුනා පමණි.*

ජාතියක් වශයෙන් නැගී සිටිය යුතු බව නොසළකා සෑම විටම ජාති, ආගම්, කුල, ගෝත්‍ර ආදී වශයෙන් බෙදී සිටීමෙන් නිපන් අයහකාරී ප්‍රතිවිපාක පිළිබඳව මෙහිදී කථිකයා අදහස් දක්වයි. මෙහි කථක චරිතය නියෝජනය කරනුයේ ලේඛකයා යැයි පාඨකයාට වක්‍රව හෝ හැඟවේ. මෙම කුල භේද හෙලා දකින අදහස් අනගාරික ධර්මපාලතුමාද තීව්‍ර කොට දක්වනු ලැබූ ඒවා වේ. පෘතග්ජන මිනිසුන්ටත් වඩා පැවිදි පිරිස කුල භේදය උලුප්පා දැක්වීමට කරන වෑයම කතුවරයා සංයමයෙන් යුතුව හෙළා දකීයි.

මව්-පිය දෙදෙනාම මත්පැන් භාවිත කිරීමට පෙළඹුණු සමාජයක් ලංකාව තුළ බිහිවීමට හේතුව වූයේද බටහිර පුරුදු කෙරෙහි ගැති වීමෙන් තමාට විශේෂ තත්ත්වයක් ලැබේ යැයි සිතන මුග්ධ පිරිසක් නිසාය. "විමලතිස්ස හාමුදුරුවන්ගේ මුදල් පෙට්ටිය" හිදී කථකයා රටේ මහත්මයා සමග කරන කථා බහේදී බටහිර ගැති වීමෙනුත්, හෙළ සභ්‍යත්වය නොතකා හැරීමෙනුත් ඇතිවන පවුල කැඩී යාම, අඹු - සැමි අනාචාරය, මත් ද්‍රව්‍ය භාවිතය හා දාරක පරිහාණිය ආදිය පිළිබඳව සාකච්ඡා වේ.

*"මම :- දිසා මහතාට "විස්කි අඩි" ගැසූ පසු මේ මව්ය, මේ පියාය, මේ භාර්යාවය, මේ දුවය, මේ පුත්‍රයාය යනාදී කිසිම වග විභාගයක් නැතිව ඕනෑ නීච දුශ්චරිතයක් කරන්ට පිළිවන්*

29 වන පිටුවට

ලෝකේශ්වරී සඳමාලි කරුණාරත්තන
සහාය කථිකාචාරිණී - සිංහල අධ්‍යනාංශය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය, ශ්‍රී ලංකාව